**බළන්ගොඩ නගර සභාව**

**2023-01-30 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව**

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2023.01.30**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ වැඩ බලන ගරු සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති (වැ/බ) | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනී | එම්.ජී. ශාන්තිලේඛා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | ඩී.එම්.ජේ.යූ ධර්මරත්න මයා |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදි. ඒ අනුව 2023-02-03 වන දින සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා මහජන ක්‍රීඩාංගනය අසල සතිපොළ පිවිසුම් මාර්ග භූමිය ලබා දීම හා 2023-01-11 දින ජන හමුවක් පැවැත්වීම වෙනුවෙන් ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ක්‍රීඩා පිටිය සඳහා ගෙවූ රුපියල් 10,000.00 ක මුදල නැවත ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් අද දින සභාව පවත්වන බව පවසන ලදී.

01. 2023-02-03 දින සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා මහජන ක්‍රීඩාංගනය අසල සතිපොළ පිවිසුම් මාර්ග භූමිය ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධව අදහස් දක්වමින් එමිල් ප්‍රියශාන්ත ප්‍රනාන්දු යන අය 2023-02-03 දින සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා මහජන ක්‍රීඩාංගනය අසල සතිපොළ පිවිසුම් මාර්ග භූමිය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර, මේ සඳහා මහජන ක්‍රීඩාංගනය හෝ ක්‍රීඩාගාරය මොනයම් හේතුවක් නිසාවෙන් හෝ භාවිතා නොකරන බවත්, පොළ පිවිසුම් මාර්ගය පමණක් භාවිත කරන බවත්, ප්‍රසංගය හේතුවෙන් රථවාහන ගමනාගමනයට හෝ දෛනික කටයුතු කෙරෙහි කිසිදු අයුරක බලපෑමක් නොකරන බවත් සඳහන් කර ඇති බව ද විදේශ ගත වූ ගරු සභාපතිතුමා විසින් මෙම යෝජනාව සභාවට යොමු කර තීරණයක් ගන්නා ලෙස සටහන් කර ඇති බැවින් අද දින විශේෂ සභාවක් කැඳ වූ බව ද පවසන ලදී.

නමුත් ඉරිදා පොළ පවත්වන දිනට පසළොස්වක පොහොය යෙදී ඇති බැවින් 2023 පෙබරවාරි 04 වන දින ඉරිදා පොළ පැවැත්වීමට තීරණය කළ බව ද ඒ සඳහා අවශ්‍ය එළවළු ඇතුළු ද්‍රව්‍ය පොළ වෙත ගෙන ඒම සිකුරාදා දින රාත්‍රියේ සිට සිදු වන බැවින් එදින සංගීත රාත්‍රියක් පැවැත්වීම නිසා බාධාවක් ඇති විය හැකි බව ද එම වේදිකාව ඇතුළු ආවරණ ඉවත් කිරීමට හා සවි කිරීමට දින 03 ක් පමණ ගත විය හැකි බව ද පොළ පැවැත්වෙන නිසා තම අකමැත්ත ප්‍රකාශ කරන බව ද වැඩිදුරටත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් සතිපොළ වෙත පිවිසුම් මාර්ග දෙකක් පවතින බැවින් වාහන මඟින් සිදුවන අවහිරතාවය සිදු නොවන බවද සංගීත ප්‍රසංගය අවසාන වූ වහාම පෙ.ව 6.00 ට පෙර වේදිකාව හැර අනෙකුත් ආවරණ ඉවත් කරන ලෙස කොන්දේසියක් පනවා ඒ සඳහා රු.100,000.00 ක මුදලක් ආපසු ගෙවන රැඳවුම් තැන්පතුවක් ලෙස තබා ගැනීම සුදුසු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් මහජනතාවට අපහසුතාවයක් නොවන පරිදි සභාවට යම් ආදායමක් ලැබෙන්නේ නම් කොන්දේසි මත මෙම යෝජනාවට කැමැත්ත පළ කල හැකි අතර, ක්‍රීඩා පිටියට හානියක් නොවන නිසා කැමැත්ත පළ කිරීමේ ගැටලුවක් නොමැති බව පැවසීය.

සභාවට යම් අදායමක් ලැබෙන බැවින් හා මහජනතාව අපහසුතාවයට පත් නොවන බැවින් ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා මෙම යෝජනාව සඳහා විරුද්ධ නොවන බව පවසන ලදී.

සභාවට ආදායමක් ලැබෙන නමුත් පොළට පැමිණෙන ලොරි රථ 30ක් පමණ මෙම ස්ථානයේ නවතා තබන බවද කල්පනා කර බලා ගැටලුවක් ඇති නොවන්නේ නම් පමණක් මෙම යෝජනාවට කැමැත්ත ලබා දෙන බව ද පවසන ලදී.

**පෙ.ව 10.24 ට පමණ ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

ගරු නාගරික මන්ත්‍රිනී එම්.ශාන්තිලේඛා මැතිතුමිය හා සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය පැවසුයේ අදාල අය කැඳවා සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවයි.

ඒ අනුව එමිල් ප්‍රියශාන්ත ප්‍රනාන්දු යන අය සමග සාකච්ඡා කිරීම සඳහා මෙන්ම අදාල කොන්දේසි පිළිබඳ දැනුම් දීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව අදාල කොන්දේසි යටතට 2023-02-04 දින පෙ.ව 6.00 ට පෙර වේදිකාව හැර අනෙකුත් ආවරණ සියල්ල ඉවත් කළ යුතු අතර, ඒ සඳහා මෙන්ම අදාල භූමිය පරිහරණයේ දී සිදු විය හැකි අලාභ වෙනුවෙන් රු.100,000.00 ක ආපසු ගෙවන ඇප තැන්පතුවක් අදාල පාර්ශවය විසින් බළන්ගොඩ නගර සභාවේ තැන්පත් කිරීම සුදුසු බව ඇතුලත් කිරීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමආරච්චි මැතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

2023-02-04 දින පෙ.ව 6.00 ට පෙර වේදිකාව හැර අනෙකුත් ආවරණ සියල්ල ඉවත් කළ යුතු අතර, ඒ සඳහා මෙන්ම අදාල භූමිය පරිහරණයේ දී සිදු විය හැකි අලාභ වෙනුවෙන් රු.100,000.00 ක ආපසු ගෙවන ඇප තැන්පතුවක් අදාල පාර්ශවය විසින් බළන්ගොඩ නගර සභාවේ තැන්පත් කිරීම හා සංගීත රාත්‍රිය වෙනුවෙන් රු.25,000.00 ක මුදලක් බළන්ගොඩ නගර සභාව වෙත ගෙවීම ඇතුලුව ඇතුලත් කර ඇති සියලුම කොන්දේසිවලට යටත්ව 2023-02-03 වන දින සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා මහජන ක්‍රීඩාංගනය අසල සතිපොළ පිවිසුම් මාර්ග භූමිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

02. 2023-01-11 දින ජන හමුවක් පැවැත්වීම වෙනුවෙන් ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ක්‍රීඩා පිටිය සඳහා ගෙවූ රුපියල් 10,000.00 ක මුදල නැවත ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2023 ජනවාරි 19 වන දින බළන්ගොඩ නගරයේ පැවති ජාතික ජන බලවේගයේ බළන්ගොඩ ආසන සමුළුව සඳහා 2023-01-11 වන දින නගර සභා ක්‍රීඩාංගනය මුදල් ගෙවා වෙන් කර ගත් නමුත් ඒ ආසන්න කාලයේ ඇති වූ අධික වර්ෂාව නිසා ක්‍රීඩාංගනයට හානි සිදු වීම හා ජනතාව අපහසුතාවයට පත් වීම සිදු විය හැකි බැවින් එම ජන හමුව ක්‍රීඩාංගනයේ නොපවත්වා වෙනත් ස්ථානයක පවත්වා ඇති බවද එම නිසා ක්‍රීඩාංගනය වෙනුවෙන් තැන්පත් කළ රු. 10,000.00 ක මුදල ආපසු ලබා දෙන ලෙසද ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ඉල්ලීමක් කර ඇති බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 10.58 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

එම්.ටී.එම්.රූමි,
සභාපති (වැ/බ),
බළන්ගොඩ නගර සභාව